සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2017 ජූලි

## (AA11) මූල්‍ය ගිණුම්කරණ මූලිකයන්

(Financial Accounting Basics)

2017-07-22
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ* ***නොහැකි*** *ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න දහසය (16) කි.

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.8 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පමය ආකෘති රාමුව අනුව මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) උපචිත පදනම. (2) අදාල බව. (3) අඛණ්ඩ පැවැත්ම. (4) ඓතිහාසික පිරිවැය.

(ලකුණු 02)

**1.2** 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, **කපිල මෝටර්ස්හි** පොත්වලින්, පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී:

| විස්තරය | රු. |
|---|---|
| 2016.04.01 දිනට ශුද්ධ වත්කම් | 325,000 |
| 2017.03.31 දිනට ශුද්ධ වත්කම් | 385,000 |
| වර්ෂය තුළ ගැනිලි (drawings) | 35,000 |
| වර්ෂය තුළ හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය | 10,000 |

ඉහත සඳහන් තොරතුරු වලට අනුව, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය) වන්නේ:

(1) (රු.105,000). (2) (රු.35,000). (3) රු.85,000/-. (4) රු.15,000/-.

(ලකුණු 02)

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක සංරචකයක් වන්නේ කුමක් ද?

(1) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (2) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.

(3) ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (4) ඉහත සඳහන් ඒවා සියල්ලම. (ලකුණු 02)

1.4 **සිල්වා** විසින් ණය පදනම මත **ඇන්ගෙන්** භාණ්ඩ මිලදී ගත් අතර, හානි වී තිබූ නිසා එම භාණ්ඩ වලින් කොටසක් **ඇන්** වෙත පසුව ආපසු හරවා යවන ලදී. පහත සඳහන් ඒවා අතුරෙන්, **සිල්වා** විසින් භාණ්ඩ ආපසු හරවා යැවීම සටහන් කිරීමට භාවිත කරනු ලබන ලියවිල්ල කුමක් ද?

(1) හර පත. (2) බැර පත.

(3) ජර්නල් වවුචරය. (4) ගැනුම් ඉන්වොයිසිය. (ලකුණු 02)

1.5 ව්‍යාපාරයක් විරාත් කාලයක් දක්වා මෙහෙයුම් කටයුතු දිගටම කරගෙන යනු ලබනු ඇතැයි උපකල්පනය කෙරෙන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) ගිණුම්කරණ කාලච්ඡේද සංකල්පය. (2) සංගතතා සංකල්පය.

(3) අඛණ්ඩ පැවැත්ම සංකල්පය. (4) උපලබ්ධි සංකල්පය. (ලකුණු 02)

1.6 ව්‍යාපාරයක ආරම්භක තොග ශේෂය රු.25,000/- කින් අඩුවෙන් සටහන් වී තිබූ අතර, අවසාන තොග ශේෂය රු.30,000/- කින් වැඩියෙන් සටහන් වී තිබුණි. මෙහි බලපෑම වන්නේ:

(1) දළ ලාභය රු.55,000/- කින් වැඩියෙන් සටහන් වීමයි.

(2) දළ ලාභය රු.55,000/- කින් අඩුවෙන් සටහන් වීමයි.

(3) දළ ලාභය රු.5,000/- කින් වැඩියෙන් සටහන් වීමයි.

(4) දළ ලාභය රු.5,000/- කින් අඩුවෙන් සටහන් වීමයි. (ලකුණු 02)

1.7 පහත සඳහන් ඒවා අතුරෙන් "පොදු ගිණුම්කරණ මෘදුකාංග" (General Accounting Software) පැකේජයක් සඳහා උදාහරණයක් **නොවන්නේ** කුමක් ද?

(1) Payroll system. (2) MYOB. (3) ACCPAC. (4) Tally. (ලකුණු 02)

1.8 බැංකුවෙන් ලබාගන්නා ලද කෙටිකාලීන ණයක් පියවීමෙන්, ව්‍යාපාරය කෙරෙහි ඇති කෙරෙන බලපෑම නිවැරදි ලෙස සඳහන් වන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශනයේ ද?

(1) වත්කම් වැඩිවීම සහ ප්‍රාග්ධනය වැඩිවීම. (2) වත්කම් අඩුවීම සහ වගකීම් වැඩිවීම.

(3) වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම. (4) වත්කම් අඩුවීම සහ වගකීම් අඩුවීම. (ලකුණු 02)

*අංක 1.9 සිට 1.16 දක්වා ප්‍රශ්න වලට නිවැරදි උත්තර, ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.9 මූල්‍ය තොරතුරු භාවිත කරන්නන් දෙදෙනෙකු(02) සඳහන් කරන්න. (ලකුණු 02)

1.10 භාණ්ඩ ලැබීමේ පත්‍රිකාවක (Goods Received Note - GRN) ඇතුලත් කරන වැදගත් කරුණු දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

1.11 පරිගණකගත කළ ගිණුම්කරණ පද්ධතියක අවාසි (බාධක) දෙකක්(02) ලැයිස්තුගත කරන්න. (ලකුණු 02)

1.12 පහත සඳහන් එක් එක් ප්‍රකාශනයට අදාලවන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න:

(a) අයිතිකරු විසින් ගැනීලි වශයෙන් රු.5,000/- ක් මුදලින් ආපසු ගැනීම සටහන් කිරීම.

(b) යන්ත්‍රෝපකරණ, අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාල පදනම මත ක්ෂය කිරීම.

(c) අඩමාන ණය සඳහා ණයගැතියන්ගෙන් රු.5,000/- ක ප්‍රතිපාදනයක් සැලසීමට තීරණය කිරීම. (ලකුණු 03)

**1.13** පහත සඳහන් ගනුදෙනු **සරත් ට්‍රේඩර්ස්** ආයතනයට අදාල වේ. පහත සඳහන් එක් එක් ගනුදෙනුව සටහන් කිරීමට අදාලවන ප්‍රාථමික සටහන් පොත හඳුනා දක්වන්න:

**(a)** රු.8,000/- ක් වටිනා සිනි **HH සිල්ලර වෙළෙන්දෝ** වෙත ණය පදනම මත විකිණීම.

**(b)** කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා රු.175,000/- කට ලිබඩු මිලට ගැනීම.

**(c)** රු.1,700/- ක් වටිනා සිනි **HH සිල්ලර වෙළෙන්දෝ** විසින් ආපසු හරවා එවීම. (ලකුණු 03)

**1.14** 2016 අප්‍රේල් 01 දින **සමන්තා පොත්හල** මගින් රු.600,000/- කට ඡායා පිටපත් යන්ත්‍රයක් අත්පත් කරගන්නා ලදි. මෙම යන්ත්‍රයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 ක් වන අතර, ප්‍රයෝජනවත් ආයුකාලය අවසානයේ ඇස්තමේන්තුගත අවශේෂ වටිනාකම රු.100,000/- කි. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය ප්‍රතිපාදන සැලසීමයි.

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය ගණනය කරන්න. (ලකුණු 03)

**1.15** පහත සඳහන් එක් එක් ප්‍රකාශයන් **සත්‍ය හෝ අසත්‍ය** යන්න සඳහන් කරන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන්න ප්‍රශ්න අංකයද සමග ඔබේ උත්තර පොතේ ලියන්න.

**(a)** වියදම් සහ ආදායම් යනු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට සෘජුවම සම්බන්ධ වන මූලිකාංග වේ.

**(b)** ස්කන්ධය යනු අස්තිත්වයක වත්කම්වලින් සියලුම වගකීම් අඩුකිරීමෙන් පසු අවශේෂ හිමිකමයි.

**(c)** පරිගණකගතකල ගිණුම්කරණ පද්ධතියක, ගනුදෙනු ගොනු (files) මගින් ප්‍රභව ලේඛණවල තිබෙන දත්ත සාරාංශගත කරනු ලබයි. (ලකුණු 03)

**1.16** කේවලස්වාමි ව්‍යාපාරයක් වන **SS ට්‍රේඩින්** හි පහත සඳහන් එක් එක් ගනුදෙනුව සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න:

**(a)** අයිතිකරු විසින් අතිරේක ප්‍රාග්ධනය වශයෙන් ව්‍යාපාරයට මුදලින් රු.800,000/- ක් ආයෝජනය කර තිබීම.

**(b)** රු.50,000/- ක වෙළෙඳ ණයගැතියෙකුගෙන් එම මුදල සම්පූර්ණයෙන් පියවා දැමීම සඳහා, මුදලින් රු.45,000/- ක් ලැබී තිබුණි.

**(c)** රු.10,000/- ක පොලී ආදායමක් බැංකු ගිණුමට ලැබී තිබුණි. (ලකුණු 06)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) පහත සඳහන් ගනුදෙනු **තාලක පොත්හලේ** 2017 ජනවාරි මාසයේ පළමුවන සතියේ ණයට මිලදී ගැනුම්වලට අදාල වේ.

| අංකය | දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරුගේ නම | අයිතම පිළිබඳ විස්තර | | | වෙළෙඳ වට්ටම |
|---|---|---|---|---|---|---|---|
| | | | | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකකයක මිල (රු.) | |
| 1 | 2017.01.01 | 101 | **සුනිමල්** | අභ්‍යාස පොත් | 100 | 90 | 2% |
| 2 | 2017.01.04 | 303 | **අමල්** | පාට පැන්සල් පෙට්ටි | 25 | 180 | - |
| 3 | 2017.01.06 | 14 | **නාමල්** | පැන්සල් | 75 | 15 | - |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 ජනවාරි මාසයේ පළමුවන සතිය සඳහා **තාලක පොත්හලේ** දෛනික ගැනුම් පොත **පිළියෙල කරන්න**.

(ලකුණු 04)

(b) කේවලස්වාමි ව්‍යාපාරිකයෙකු වූ **රෝස්ගේ** ව්‍යාපාරයේ පොත්වලින් 2017 මාර්තු මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු උපුටාගන්නා ලදී:

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2017.03.01 | රු.500,000/- ක් මුදලින් ආයෝජනය කර **රෝස්** ව්‍යාපාරය ආරම්භ කරන ලදී. |
| 2017.03.05 | නැවත විකිණීම සඳහා රු.750,000/- ක භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදී. |
| 2017.03.15 | රු.300,000/- ක පිරිවැය වූ තොග, පිරිවැය මත 10% ක ලාභ ආන්තිකයක් සහිතව මුදලට විකුණන ලදී. |
| 2017.03.20 | සැපයුම්කරුවෙකුට රු.200,000/- ක් ගෙවන ලදී. |
| 2017.03.25 | 2017 මාර්තු මාසය සඳහා රු.10,000/- ක විදුලි බිල්පත ගෙවන ලදී. |
| 2017.03.31 | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා ණය පදනම මත රු.100,000/- කට පරිගණකයක් මිලදී ගන්නා ලදී. |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සටහන් කරන්න**.

*[ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්) + තොග + ණයගැතියෝ + මුදල් = හිමිකම + වගකීම්]*

(ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**NYK ට්‍රේඩර්ස්** ව්‍යාපාරයට අළුතෙන් පත්කළ පොත් තබන්නිය **අමාලි** වන අතර, 2017 මාර්තු 31 දිනට ඇය විසින් පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවීය. වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරුකොට කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන අනුව රු.175,000/- ක ලාභයක් පෙන්නුම් කරන ලදී.

පහත දැක්වෙන වැරදි පසුව හඳුනාගන්නා ලදී:

(1) රු.60,000/- ක ණයට ගැනුම්, ගැනුම් ගිණුමට රු.6,000/- ක් ලෙස හර කරන ලද අතර, බැර සටහන නිවැරදි ලෙස සටහන් කර තිබුණි.

(2) රු.1,200/- ක දුරකතන වියදම්, රු.2,100/- ක් ලෙස විදුලි වියදම් ගිණුමේ සටහන් කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(3) මුදල් පොතේ සටහන් කර තිබූ රු.750/- ක ලිපිද්‍රව්‍ය වියදම්, ලිපිද්‍රව්‍ය වියදම් ගිණුමේ සටහන් කර නොතිබුණි.

(4) රු.25,000/- ක ණයට විකිණීමක්, වෙළෙඳ ණයගැතියෝ සහ විකුණුම් යන ගිණුම් දෙකේම දෙවතාවක් සටහන් කර තිබුණි.

(5) රු.5,000/- ක පොලී වියදමක්, පොලී ආදායම් ගිණුමට බැර කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදි ලෙස සටහන් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් **පිළියෙල කරන්න**. (ලකුණු 06)

(b) **NYK ට්‍රේඩර්ස්** ව්‍යාපාරයේ 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගලපන ලද ලාභය (අලාභය) **ගණනය කරන්න**.

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**"ප්‍රදීප් එන්ටර්ප්‍රයිසස්"** නම් වූ ව්‍යාපාරය පවත්වාගෙන යන **ප්‍රදීප්** කේවලස්වාමි ව්‍යාපාරිකයෙකි. **ප්‍රදීප් එන්ටර්ප්‍රයිසස්හි** 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත සඳහන් පරිදි විය:

**ප්‍රදීප් එන්ටර්ප්‍රයිසස්**
**2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | රු. | රු. |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| කාර්යාල උපකරණ | | 400,000 |
| **ජංගම වත්කම්:** | | |
| වෙළෙඳ ණයගැතියෝ | 250,000 | |
| මුදල් | 50,000 | 300,000 |
| | | **700,000** |
| | | |
| ප්‍රාග්ධනය | | 500,000 |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ණයහිමියෝ | | 200,000 |
| | | **700,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2016 මාර්තු 31 දින රු.400,000/- කට කාර්යාල උපකරණ මිලට ගෙන ඇති අතර, ඒවා සරල මාර්ග ක්‍රමය යටතේ, පිරිවැය මත වර්ෂයකට 10% බැගින් වූ අනුපාතිකයකට ක්ෂය කරනු ලැබේ.

(2) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් සහ ගැනුම් පහත සඳහන් පරිදි විය:

| | රු. |
|---|---|
| විකුණුම් | 900,000 |
| ගැනුම් | 650,000 |

සියලුම ගැනුම් සහ විකුණුම් ණය පදනම මත විය.

(3) 2017 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

(4) 2017 මාර්තු 31 දිනට වෙළෙඳ ණයගැතියන් සහ වෙළෙඳ ණයහිමියන් පහත සඳහන් පරිදි විය:

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 100,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 170,000 |

(5) රු.200,000/- ක බැංකු ණය මුදල, වර්ෂයකට 10% බැගින් වූ ස්ථාවර පොලී අනුපාතයක් මත 2016 අප්‍රේල් 01 දින ලබාගන්නා ලදී. මෙය සමාන වාර්ෂික වාරික දෙකකින් ආපසු ගෙවිය යුතු විය. ප්‍රථම වාර්ෂික වාරිකය පොලිය ද සමග 2017 මාර්තු 31 දිනට ගෙවිය යුතු වූ අතර, එය 2017 අප්‍රේල් 10 දින ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනට **ප්‍රදීප් එන්ටර්ප්‍රයිසස්** ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

පහත සඳහන් තොරතුරු වීදුරු බෝතල් නිෂ්පාදකයෙකුගේ පොත්වලින් 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා උපුටාගන්නා ලදී:

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් | 1,750,000 |
| වැටුප් - නිෂ්පාදන කළමනාකරු | 250,000 |
| ගෙනඒමේ කුලී - අමුද්‍රව්‍ය | 300,000 |
| නිෂ්පාදන ශ්‍රමිකයන්ගේ සෘජු වේතන | 950,000 |
| ගොඩනැගිලි කුලිය | 250,000 |
| කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ මත ක්ෂය | 300,000 |
| ආරක්ෂක වියදම් | 120,000 |
| විදුලිය වියදම් | 275,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) තොග පහත සඳහන් පරිදි අගය කර ඇත:

| | 2016 අප්‍රේල් 01 දිනට (රු.) | 2017 මාර්තු 31 දිනට (රු.) |
|---|---|---|
| අමුද්‍රව්‍ය | 2,300,000 | 1,800,000 |
| නොනිමි වැඩ (මූළ නිෂ්පාදන පිරිවැයට අගය කළ) | 1,050,000 | 710,000 |

(2) පහත සඳහන් වියදම් පහත පරිදි බෙදා වෙන් කළ යුතුය:

| | කර්මාන්ත ශාලාව | කාර්යාලය |
|---|---|---|
| ගොඩනැගිලි කුලිය | 80% | 20% |
| ආරක්ෂක වියදම් | 75% | 25% |
| විදුලිය වියදම් | 80% | 20% |

(3) සෘජු වේතන වලට අමතරව, වර්ෂය තුළ නිෂ්පාදනය කරනු ලබන එක් එක් බෝතලයකට රු.10/- බැගින් දිරි දීමනාවක් ලබා ගැනීමට නිෂ්පාදන ශ්‍රමිකයන්ට හිමිකම් ඇත. වර්ෂය තුළදී නිෂ්පාදනය කරන ලද මුළු බෝතල් සංඛ්‍යාව 8,000 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම **පිළියෙළ කරන්න**. (ලකුණු 08)

(b) එක් වීදුරු බෝතලයක නිෂ්පාදන පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න එක (01) කි.

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**NN ට්‍රේඩර්ස්** යනු **නිශාන්තට** අයත් කේවලස්වාමි ව්‍යාපාරයකි. 2017 මාර්තු 31 දිනට **NN ට්‍රේඩර්ස්හි** ශේෂ පිරික්සුම පහතින් දී ඇත:

**NN ට්‍රේඩර්ස්**
**2017 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට): | | |
| ඉඩම සහ ගොඩනැගිලි | 10,000 | |
| කාර්යාල උපකරණ | 6,500 | |
| ලී බඩු සහ සවිකිරීම් | 5,000 | |
| 2016 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 2,600 |
| කාර්යාල උපකරණ | | 1,500 |
| ලී බඩු සහ සවිකිරීම් | | 2,500 |
| 2016 අප්‍රේල් 01 දිනට, තොග | 2,800 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 18,500 | 16,600 |
| ගැනිලි | 1,300 | |
| 2016 අප්‍රේල් 01 දිනට, අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | | 750 |
| ගැනුම් / විකුණුම් | 20,000 | 37,000 |
| ප්‍රදර්ශනාගාර කුලිය | 1,500 | |
| විදුලිය | 2,550 | |
| ජලය | 1,500 | |
| වැටුප් සහ වේතන | 3,500 | |
| කාර්යාල නඩත්තු වියදම් | 1,650 | |
| බැංකුවේ ඇති මුදල් | 3,700 | |
| අතැති මුදල් | 1,900 | |
| ප්‍රචාරණ වියදම් | 1,100 | |
| 2016 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | | 20,550 |
| | **81,500** | **81,500** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2017 මාර්තු 31 දිනට අවසාන තොගය පහත සඳහන් පරිදි අගය කර තිබුණි:

| | රු. |
|---|---|
| පිරිවැයට | 5,400,000 |
| ශුද්ධ උපලබ්ධි අගයට (Net Realizable Value - NRV) | 5,450,000 |

(2) ඉඩමේ වටිනාකම රු.4,000,000/- ක් වන අතර, ව්‍යාපාරයේ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය වන්නේ දේපළ, පිරියත සහ උපකරණ පහත දැක්වෙන අනුපාතික යටතේ, සරල මාර්ග ක්‍රමය භාවිත කරමින් පිරිවැය මත, ක්ෂය කිරීමයි:

| | |
|---|---|
| ගොඩනැගිලි | වාර්ෂිකව 10% |
| කාර්යාල උපකරණ | වාර්ෂිකව 20% |
| ලිබඩු සහ සවිකිරීම් | වාර්ෂිකව 25% |

(3) **රුවන්ගෙන්** ලැබිය යුතු රු.500,000/- ක මුදල බොල්ණයක් ලෙස ලියාහැරීමට **නිශාන්ත** තීරණය කර ඇති අතර, 2017 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් අඩමාන ණය සඳහා 5% ක පොදු ප්‍රතිපාදනයක් සැලසීමටද ඔහු තීරණය කර ඇත.

(4) **නිශාන්ත** විසින් **NN ට්‍රේඩර්ස්හි** නව ප්‍රදර්ශනාගාරයක් 2016 අප්‍රේල් 01 දින විවෘත කරන ලද අතර, නව ප්‍රදර්ශනාගාරය සඳහා කුලිය මාසයකට රු.150,000/- ක් බැගින් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරික්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |